# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012
2015 මාර්තු - මැයි

මානවශාස්ත්‍ර පීඨය

දෘශ්‍ය කලා හා සැළසුම්කරණය - VIAD E 2025

ශ්‍රී ලංකාවේ සමකාලීන කලාව

<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි | කාලය : පැය 03 යි

---

01. මුදලිඳු ඒ.සී.ජී.එස්. අමරසේකර සහ ඩේවිඩ් පේන්ටර් ගේ සිතුවම් කලාව පිළිබඳ විමසීමක් කරන්න.

02. 43 කණ්ඩායමට අයත් ශිල්පීන් අතරින් ඔබ කැමති ඕනෑම එක් ශිල්පියෙකුගේ කලාව පිළිබඳ ඇගයීමක් කරන්න.

03. සමකාලීන සිත්තරුන් සිය වස්තු විෂය තෝරා ගැනීමේ දී සහ මාධ්‍ය භාවිතයේ දී පළ කරන නව ප්‍රවණතා කවරේද? විමසන්න.

04. එම්. සාර්ලිස් මාස්ටර් ගේ විහාර බිතු සිතුවම් කලාව බෞද්ධාගමික විහාර බිතු සිතුවම් කලාව වෙනසකට පාත්‍ර කළේ යැයි ඔබ සිතන්නේ ද? හේතු දක්වමින් ඔබේ මතය පැහැදිලි කරන්න.

05. ස්ථාපන කලාව වර්තමාන දෘශ්‍ය කලා භාවිතය ප්‍රබල වෙනසකට යොමු කරන්නේ දැයි සාකච්ඡා කරන්න.

06. යුද්ධය හා භීෂණය නූතන ශ්‍රී ලාංකික සිත්තරුන් ගේ ප්‍රකාශනයේ ප්‍රබල අවියක් වී ඇති අයුරු තත්කාලීන සිත්තරුන්ගේ නිර්මාණ ඇසුරින් සාකච්ඡා කරන්න.

07. ඔබ ගේ අවධානයට වඩාත් පාත්‍ර වූ සමකාලීන සිතුවම් ප්‍රදර්ශනයක් පිළිබඳ විචාරයක් කරන්න.

********************************